


ලංකා සතොස ලිමිටඩ් රට පුරා පිහිටි සිය වෙළඳ ජාලයෙහි සංවිධානයට නායකත්වය දීම සඳහා කාර්යශූර පුද්ගලයින් සොයනු ලැබේ. ලංකා සතොස යනු රාජ්‍ය අංශයේ විශාලතම වෙළඳ ජාලය වන අතර 2021/22 දී එහි මාවත සහ ආදායම නවීකරණය කර වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

# නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොන්ත්‍රාත් පදනම)

## මානව සම්පත් හා පරිපාලන

**සුදුසුකම්:**
**බාහිර අපේක්ෂකයින්. (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / නීතිය පිළිබඳ උපාධියක්,
   සමග
   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Masters') සුදුසුකම
   සහ
   අවම වශයෙන් අවුරුදු 15 ක සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සනාථ කළ ඇගයුම් වාර්තාවක් සහිතව කළමණාකරන මට්ටමින් සේවය කර ඉන් වසර 05 ක් "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින්" සේවය කර තිබීම.
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය
   සමග
   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමින්" අවම වශයෙන් අවුරුදු 15 ක පළපුරුද්දක් ඇති ඉන් වසර 5 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද, සනාථ කළ ඇගයුම් වාර්තාවක් සහිතව තිබිය යුතුය.

## තොරතුරු තාක්ෂණ

**සුදුසුකම්:**
**බාහිර අපේක්ෂකයින්. (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව / පරිගණක විද්‍යාව මූලික විෂය ලෙස වසර 3ක උපාධිය / කළමණාකරන තොරතුරු පද්ධති/ ව්‍යාපෘතිය සමග බ්‍රිතාන්‍ය පරිගණක සංගමයෙහි පූර්ණ සුදුසුකම
   සමග
   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Masters') සුදුසුකම
   සහ
   අවම වශයෙන් අවුරුදු 15 ක සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සනාථ කළ ඇගයුම් වාර්තාවක් සහිතව කළමණාකරන මට්ටමින් සේවය කර ඉන් වසර 05 ක් "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින්" සේවය කර තිබීම.
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ IESL හෝ BCS පූර්ණ සාමාජිකත්වය
   සමග
   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමින්" අවම වශයෙන් අවුරුදු 15 ක පළපුරුද්දක් ඇති ඉන් වසර 5 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද, සනාථ කළ ඇගයුම් වාර්තාවක් සහිතව තිබිය යුතුය.

## ඉංජිනේරු

**සුදුසුකම්:**
**බාහිර අපේක්ෂකයින්. (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් හෝ යාන්ත්‍රික හෝ විදුලි ඉංජිනේරු මූලික උපාධිය හෝ IESL හි ඒකාබද්ධ සාමාජිකත්වය සහිතව IESL හි 1/2/3 විභාග
   සමග
   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Masters') සුදුසුකම
   සහ
   අවම වශයෙන් අවුරුදු 15 ක සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සනාථ කළ ඇගයුම් වාර්තාවක් සහිතව කළමණාකරන මට්ටමින් සේවය කර ඉන් වසර 05 ක් "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින්" සේවය කර තිබීම.
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (IESL) පූර්ණ සාමාජිකත්වය
   සහ
   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමින්" අවම වශයෙන් අවුරුදු 15 ක පළපුරුද්දක් ඇති ඉන් වසර 5 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද, සනාථ කළ ඇගයුම් වාර්තාවක් සහිතව තිබිය යුතුය.

**වැටුප් සහ අනෙකුත් දීමනා:**

මූලික වැටුප රු. 150,000.00.
(කාර්ය සාධන දීමනාව රු.75,000/-+ ප්‍රවාහන දීමනාව රු.50,000/- + රාජ්‍ය චක්‍රලේඛණ වලට අනුකූලව තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාව+ ජංගම දුරකථන ප්‍රතිපූර්ණය රු.9000/- )

**වයස**

අවුරුදු 45 ට නොඅඩු සහ අවුරුදු 60 ට නොවැඩි විය යුතුය.

**නිසි අපේක්ෂකයා හට:**

- දත්ත ඇගයීමට, සමාලෝචනය කිරීමට, අර්ථ නිරූපණය කිරීමට සහ උසස් ස්වයං අභිප්‍රේරණයක් ඇති පුද්ගලයකු විය යුතු අතර විශිෂ්ට විශ්ලේෂණාත්මක, ගැටලු විසඳීමේ සහ සංවිධානය කිරීමේ කුසලතා තිබිය යුතුය.
- ශක්තිමත් නායකත්ව ගුණාංග, අන්තර් පුද්ගල සන්නිවේදන කුසලතා තිබීම.
- මනා තොරතුරු තාක්ෂණ කුසලතා විදහා දැක්වීමට හැකි වීම.
- බහු විධ කණ්ඩායම් වලට නායකත්වය දීමට හා මෙහෙයවීමට සනාථ කළ හැකි හැකියාවක්. මානව හා අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීම හා කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුයි.

**සෑම අයදුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

ඔබට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද තිබේ නම් කරුණාකර මෙම දැන්වීමෙන් දින 14 ක් ඇතුළත ඔබේ ජීව දත්ත පිටපත, සහතික පත්‍ර පිටපත් සමග email මගින් **vacancies@lankasathosa.org** වෙත යොමු කරන්න.

**(මෙම ආයතනය විසින් කෙටි ලැයිස්තුගත අපේක්ෂකයින් පමණක් සම්බන්ධ කරගනු ලැබේ)**

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්, CWE මහලේකම් ගොඩනැගිල්ල,
අංක. 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

සතොස